# 11

# ගුණනුවණ නැති අය ඇසුරට නොගත යුතු ම ය

සමාජයේ ජීවත් වන අපට නිරතුරුව ම එහි සෙසු සාමාජිකයන් සමග එක් ව විසීමට සිදු වෙයි. විවිධ සබඳතා හිතවත්කම් පැවැත්වීමට ද සිදු වෙයි. එහි දී සමාජයෙන් අපට ද අපෙන් සමාජයට ද විවිධාකාර වූ බලපෑම් ඇති වීම වැළැක්විය නො හැකි ය. මන්ද, සෑම පුද්ගලයකුට ම සමූහගත ව ජීවත් වීමට සිදු වී ඇති බැවිනි. එම සමූහගත ජීවිතයට මිනිස්සු ප්‍රිය කරති. අපට සමාජයෙන් ඇති වන සමහර බලපෑම් සැබවින් ම අපගේ දියුණුවට, සැපතට, උපකාරි වන්නේ ය. එසේ ම තවත් සමහර බලපෑම් අපගේ පිරිහීමට හා දුක් දොම්නස්වලට හේතු වන්නේ ය. එසේ වන්නේ සමාජයේ සියලු මිනිසුන් එක සමාන නො වන බැවිනි. ඔවුහු සිතුම්පැතුම්වලින් ගතිගුණවලින් විවිධාකාර වෙති. එසේ ම ඇවතුම් පැවතුම් හා ක්‍රියාකාරකම්වලින් ද විවිධාකාර වෙති. එබැවින් සමාජය තේරුම් ගෙන කටයුතු කිරීම ඉතා වැදගත් කරුණකි. සමාජ ඇසුර පැවැත්වීමේ දී අප වඩාත් බුද්ධිමත් විය යුතු ය. දුරදිග කල්පනා කළ යුතු යැයි බුදු දහමෙහි නොයෙක් තැන නොයෙක් විට උගන්වා ඇත්තේ එබැවිනි. මිත්‍ර ප්‍රතිරූපකයන්, පාප මිත්‍රයන්, බාලයන්, අසත් පුරුෂයන් ඇසුරෙන් තොර ව ජීවත් විය යුතු යැයි බුදුරජාණන් වහන්සේ වදාළහ. එසේ උගන්වා ඇත්තේ එබඳු පහත් මිනිසුන් ඇසුරු කිරීමෙන් අපට සිදුවිය හැකි අයහපත ද අවැඩ ද පෙන්වා දෙමිනි. මෙලොව වශයෙන් මෙන් ම පරලොව වශයෙන් ද එබන්දන් ඇසුරු කිරීමෙන් සිදු වන අවැඩ විවිධාකාර ය. එසේ ම කල්‍යාණ මිත්‍රයන්, සුහද මිත්‍රයන්, පණ්ඩිතයන්, සත්පුරුෂයන් ඇසුරු කරමින් ජීවත් විය යුතු යැයි ද බුදුරජාණන් වහන්සේ වදාළහ. එසේ දේශනා කොට ඇත්තේ එබඳු උතුම් මිනිසුන් ඇසුරු කිරීමෙන් අපට සිදුවන යහපත ද සුව සෙත ද පෙන්වා දෙමිනි.

බුද්ධ ධර්මය අනුව අප ඇසුරු කළ යුත්තේ අපට වඩා ගුණනුවණින් දියුණු වූ උතුමන් ය. ඔවුහු ශ්‍රේෂ්ඨයෝ වෙති. අපට වඩා සිල්වත්කමින් ගුණවත්කමින් නැණවත්කමින් වැඩි දියුණු වූවෝ වෙති. බුදු දහම එවැනි උතුම් පුද්ගලයන් පණ්ඩිතයන් ලෙස හඳුන්වයි. ඔවුහු යහපත් වැඩදයක සිතුවිලි සිතති. යහපත් වැඩදයක කටයුතු කරති. ඔවුන් උපමා කරන්නේ සමාජයේ සරු ගසකටයි. එවැන්නන් ඇසුරෙන් අපට ලබා ගත හැකි ප්‍රයෝජන බොහෝ ය. අපගේ මෙලොව පරලොව දියුණුවට ද ගුණනුවණ වැඩීමට ද එවන් උතුමන් ඇසුර උපකාරී වෙයි; ඵලදයක වෙයි. සවි ශක්තිය වැඩි ගස් වැනි එබඳු පුද්ගලයන්ට අපට ද ශක්තිය ලබා දිය හැකි ය. වාත වේගයෙන් ඇද නො වැටෙන ගස් වැනි එබඳු උතුමෝ අටලෝ දහමින් කම්පා නො වන්නෝ ය. අපගේ අනාගත ජීවිතයට දිරි දීමට හැකි වන්නේ එබඳු ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ට ය. පැතිර ගිය අතුපතර ඇති ගසක් අපට සෙවණ දෙන්නාක් මෙන් එබඳු උතුමෝ අපට සෙවණක් වෙති. එවැන්නන් ඇසුරෙන් කිසි ද අවැඩක් නො වේ; වැඩක් ම සිදු වෙයි; අයහපතක් නො වේ; යහපතක් ම වෙයි;

පිරිහීමක් නො වේ; දියුණුවක් ම වෙයි; සැප සම්පත් ම ළඟා වෙයි. එබඳු ශ්‍රේෂ්ඨ උත්තමයෝ නම් බුද්ධාදී රහතන් වහන්සේලා ය; ආර්ය පුද්ගලයෝ ය; දැන උගත්කම් ඇති ඒ දැන උගත්කම් අනුව චරිතය හැඩ ගසා ගත් සිල්වත් ගුණවත් පැවිදි උතුමෝ ය; ගිහි උතුමෝ ය; ගුණනුවණින් සරු ගුරුවරු ය; මාපියන් ය.

අපට වැඩි ගුණනුවණ ඇති එබඳු උතුමන් ඇසුර නිසා සිදුවන්නේ සැපතක් ම ය. ඒ ශ්‍රේෂ්ඨ උත්තමයෝ අපට පරමාදර්ශී වෙති. ඔවුන් අනුව යන අපට ද ඔවුන් හා සමාන වූ දැන උගත්කම් ද සිල්වත් ගුණවත්කම් ද ළඟා කර ගැනීමට හැකි වෙයි. ඒ උතුමෝ අප යහමග යවති; නොමග නො යවති. අවවාදයෙන් අනුශාසනයෙන් අපගේ අනාගත ජීවිතය ගොඩනගා ගැනීමට මග පෙන්වති. අපගේ දුබලකම් අඩුපාඩුකම් පෙන්වා දෙමින් ඒවා නැති කර ගැනීමටත්, අප සතු හැකියාවන්, සමත්කම් තේරුම් ගනිමින් ඒවා වැඩි දියුණු කර ගැනීමටත් ශ්‍රේෂ්ඨ උත්තමයෝ උපකාරී වෙති. බුදුරජාණන් වහන්සේගේ ඇසුර, අවවාදය හා ආදර්ශය ද ලබා ගත් කෝලිත උපතිස්ස යන තරුණ මානවකයන් සියලු කෙලෙස් නසා රහත් වූ සැටි ද අගසව් තනතුරු ලැබීමට පවා සුදුසු වූ සැටි ද අප අසා ඇත. එමෙන් ම ආනන්ද ආදී මහ තෙරවරු ද තමාටත් සමාජයටත් බොහෝ වැඩ ඇති පැවිද්දන් බවට පත් වූහ. අනඳ තෙරණුවෝ අග්‍ර උපස්ථායක, ධර්ම භාණ්ඩාගාරික තනතුරු ලැබීමට පවා සුදුසු වූහ. නොමග ගිය අංගුලිමාල බොහෝ සාහසිකකම් කළ සැටි ද බුදුරදුන් ඇසුරින් අවවාද ආදර්ශ ලබා ගනිමින් සියලු කෙලෙස් නසා රහත් වූ සැටි ද ඔබ අසා ඇත. ඒ තමන්ට වඩා ශ්‍රේෂ්ඨ වූ උතුමන් ඇසුරෙන් ලද ප්‍රතිඵල වෙයි.

පහත් පුද්ගලයන් ආශ්‍රය කිරීමෙන් අප ද ඒ තත්ත්වයට ඇද වැටෙන්නට ඉඩ ඇත. එබඳු ගුණනුවණින් පිරිහී ගිය මිනිසුන් ඇසුර නිසා කායික හා මානසික නීරෝග බව නැති වී අපි දුබල රෝගීන් වෙමු. අපගේ නුවණ ද පිරිහී ගොස් ඉගෙනීම් කටයුතු ද අසාර්ථක වෙයි; අප සතු සම්පත් ද අපට අහිමි වෙයි; ජීවිතයේ මෙලොව පරලොව සතුට සැනසුම නැති වී යයි; සාමයෙන් ජීවත් වීමේ අවස්ථාව ද අහිමි වෙයි; අපකීර්තිය ද පැතිර යයි.

ගුණනුවණින් අපට වඩා දියුණු උතුමන් ඇසුර නිසා සිත ද කය ද නීරෝග වෙයි; වැඩෙයි; ශක්තිමත් වෙයි. අපගේ නුවණ දියුණු වීමෙන් ඉගෙනීමේ කටයුතු ද සාර්ථක වේ. අප සතු සම්පත් රැකෙයි; වැඩි දියුණු වෙයි; ජීවිතයේ මෙලොව පරලොව සතුට සැනසුම උදා වෙයි; සාමයෙන් ජීවත් විය හැකි වෙයි; අපගේ කීර්තිය ද පැතිර යයි.

අපට වඩා උතුම් ගුණනුවණ ඇති ශ්‍රේෂ්ඨ උතුමන් ඇසුරු කිරීමට නො ලැබේ නම් අප කුමක් කළ යුතු ද? බුදු දහම උගන්වන්නේ තමා හා සම සම ව ගුණනුවණ ඇතියවුන් ඇසුරු කළ යුතු බව ය. එබඳු පුද්ගලයන් සිටිය දී ම තමාට වඩා ගුණනුවණින් අඩු වූවන් ඇසුරු කිරීම සරු ගසක් නිසරු ගස් පිරිවර කොට ගැනීමක් වැනි ය. එයින් සිදු වන්නේ තමා ද එබඳු පහත් පුද්ගලයන් නිසා පහත් තත්ත්වයට ම ඇද වැටීම ය. ඔවුහු පිරිහීමට අනුබල දෙන අපාය සහාය මිත්‍රයෝ ය. අප තරමටවත් ගුණවත් සිල්වත් නො වන අප තරමටවත් දැන උගත් නො වන මිතුරන් ඇසුරෙන් අපට ලද හැකි දේ කුමක් ද? ලද හැක්කේ අයහපතක් ම ය; අපගේ පිරිහීමට හේතු වන නරක පුරුදු ය; දුසිරිත් ය. ඒ සියල්ල අප පසුපස දුක් පීඩා දෙමින් ඇදී එයි. ගුණනුවණින් අපට වඩා වැඩි මිතුරන්, ගුරු දෙගුරුන් හෝ වැඩිහිටියන් හෝ දක්නට නො ලැබේ යැයි ගුණනුවණින් අපට වඩා

අඩු වූවන් ඇසුරු නො කළ යුතු ය. එය ද අයහපත් ය; අවැඩදායක ය; දුක් පිණිස ම වේ. එවැනි අවස්ථාවක දී අප ඇසුරට තෝරාගත යුත්තේ අප හා සමසමව ගුණනුවණ ඇත්තවුන් ය. එවැනි අය තේරුම් ගෙන ඔවුන් ඇසුරු කළ යුතු ය. එයින් පිරිහීමක් නො වේ; දියුණුවක්ම ඇති වෙයි; දුක් පීඩා නො වේ; සැප සැනසිලි ම ලැබේ. හැදෙන වැඩෙන හොඳ අනාගතයක් ඇති, කළ පින් ඇති බෞද්ධ දරුවකු තමා තරම්වත් ගුණනුවණ නැති සුරාවට සූදුවට පුරුදු වූ අනුවණකම් කරන පව්වු මිතුරන් ඇසුරට වැටුණු විට සිදුවන්නේ කුමක් ද? ඔහු ද ඒ මිතුරන් නිසා දුසිරිත්වලට යොමු වීමයි. එයින් ඔහුගේ අනාගතය අඳුරු වෙයි. ඔහුට මෙන් ම බොහෝ බලාපොරොත්තු ඇති ව ඔහුට මග පෙන්වූ ගුරුවරුන්ට ද හැදූ වැඩූ දෙමාපියන්ට ද දුකට, කනස්සල්ලට පත්වීමට සිදු වෙයි. එබැවින් උසස් ගුණනැණ ඇති උතුමන් ඇසුරට නො ලැබේ නම් සම ගුණනැණ ඇති මිතුරන් ඇසුරු කිරීම සුදුසු ය. එය හැම අතින් ම යහපත පිණිස පවතියි.

තමාට වඩා උසස් ගුණ ඇති නුවණ ඇති ශ්‍රේෂ්ඨයන් හෝ තමා මෙන් ම සම ගුණනුවණ ඇති හිතවතුන් හෝ ඇසුරට නො ලැබේ නම් කළ යුත්තේ හුදකලාව විසීම ය. උතුමකු නොමැති නම් පහත් අයකු ඇසුරට යනවාට වඩා එය යහපත් ය; බුද්ධිමත් ය. එ මගින් තමා තුළ ඇති ගුණනුවණ නොපිරිහී පවතියි. තමාගේ ජයග්‍රහණ තමාට ම ලබා ගැන්මට ඇති ඉඩකඩ ආවරණය නො වේ. බුදුරජාණන් වහන්සේ ද අනුවණයන් ඇසුරට වඩා හුදකලා වාසය යහපත් යැයි පාරිලෙය්‍ය වනයට වැඩම කළහ; හුදකලාව විසූහ.

> ඇසුරු කිරීමට සුදුස්සකු නොමැති පරිසරයක් තුළ කෙනකුට කළ හැකි බුද්ධිමත් දේවලින් එකකි, එසේ හුදකලාව විසීම; තමාගේ පාඩුවේ තම දියුණුවට යහපතට වැඩ කර ගැනීම; තමා සතු ගුණ නුවණ රැකගනිමින් එහි වැඩි දියුණුව සඳහා ක්‍රියා කිරීම. එයින් පාප මිත්‍රයන් ඇසුරු කිරීමෙන් සිදුවන අවැඩ වැළකී යයි.

මෙයින් අදහස් කරන්නේ බාලයන් අසත්පුරුෂයන් පාප මිත්‍රයන් ලෙස බුදු දහම හඳුන්වා දෙන්නවුන් සමග අමනාප වීම නො වේ. ඔවුන් හා ගැටුම් ඇති කර ගැනීම ද නො වේ. ඉවසිලිමත් මැදිහත් බොදු දරුවකු හෝ වැඩිහිටියකු විසින් කළ යුත්තේ පාප මිත්‍රයන්ට ද්වේෂ කිරීමෙන්, වෛර කිරීමෙන්, පහර දීමෙන්, විරුද්ධ වීමෙන් තොර ව උපේක්ෂාවෙන් හා දයාවෙන් ඔවුන් දෙස බැලීම ය; ඔවුන්ට අනුකම්පා කිරීම ය. බුද්ධාදී උතුමන්ගේ අවවාදය ද ආදර්ශය ද එයයි. මැදිහත් විචාර පූර්වක මනා හැදියාවක් ඇති දරුවකු කළ යුත්තේ තමාට වඩා ගුණනුවණින් පිරිහුණු මිතුරන්ට ළං නොවීම ය. ඔවුන්ගේ අවවාද ආදර්ශ ලබා නො ගෙන සිටීම ය. එක්කෝ තමාට වඩා ගුණනුවණ ඇති උතුමන් ඇසුරු කළ යුතු ය. එසේ නො වේ නම් තමා හා සම ගුණනුවණ ඇති මිතුරන් ඇසුරු කළ යුතු ය. එම දෙයාකාරයේ ම පුද්ගලයන් නැති කල්හි හුදකලාව තමාගේ දියුණුවට කටයුතු කර ගැනීම බෞද්ධ දරුවකුගේ පිළිවෙතයි. බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කර ඇත.

**වරං චේ නාධිගච්ඡෙය්‍ය**

**සෙය්‍යං සදිසමත්තනෝ,**

**ඒකචරියං දළ්හං කයිරා**

**නත්ථි බාලේ සහායතා.**

ධම්ම පදයේ බාලවග්ගයේ සඳහන් මෙම ගාථාවෙන් කියැවෙන්නේ ඇසුරු කිරීමට කෙනකු සොයන්නා විසින් තමහට වැඩි තරම් වූ හෝ සමාන වූ හෝ කෙනකු නොලදහොත් තනි ව වාසය කිරීම සුදුසු බව ය. ඇසුරු කරන්නකුගෙන් ලැබිය යුතු ගුණ බාලයා ළඟ නැති බව ද එයින් කියැවේ. මෙබඳු ධම්මපද ගාථා හදරා අපේ දිවිය ඔපවත් කර ගැනීමට ක්‍රියා කරමු.

## සාරාංශය

විසම සමාජයක ජීවත් වන අප එහි මිනිසුන් දැන හැඳින ගෙන කටයුතු කිරීම ඉතා වැදගත් කරුණකි. ඒ අනුව තමාට වඩා වැඩි ගුණනුවණ ඇත්තවුන් ඇසුරු කිරීමට ද එබඳු උතුමන් නො වේ නම් තමා මෙන් ම සමාන යහපත් සිතුම් පැතුම් ඇති ගුණනුවණ ඇති මිතුරන් ඇසුරු කිරීමට ද ඒ කිසිවකුත් නො වේ නම් හුදකලාව තමන්ගේ පාඩුවේ වැඩකටයුතු කිරීමට ද බුදු දහම මග පෙන්වයි. එම පිළිවෙත නිසැක ව ම බාලයන් ඇසුරෙන් සිදුවන අවැඩ අයහපත වළක්වයි; හිතසුව සලසයි; දියුණුවට හේතු වේ. අපි ද ඒ අනුව කටයුතු කිරීමට යොමු වෙමු.

## ක්‍රියාකාරකම්

01. තමාට වඩා ගුණනුවණ ඇති උතුමකු ඇසුරු කිරීමෙන් දරුවකුට සිදුවන යහපත පෙන්වා දෙන්න.

02. ගුණනුවණින් පිරිහුණු බාලයකු ඇසුරු කිරීමෙන් දරුවකුට සිදුවන අයහපත පැහැදිලි කරන්න.

03. තමාට සම ගුණනුවණ ඇති අයකු තේරුම් ගන්නේ කෙසේ දැයි පෙන්වා දෙන්න.

## පැවරුම

දුදන ඇසුරෙහි ආදීනව හා සුදන ඇසුරෙහි ආනිසංස ද පැහැදිලි කරමින් ශිෂ්‍ය සමිතිය ඉදිරියේ කථාවක් පවත්වන්න.

## පුහුණුවට

ගුණනැණ බෙලෙන් වැඩි උතුමකු තමන් හට
යහ ගුණවලින් සම අයකුදු ලබන්නට
නොහැකි ම වුණොත් දුදනන් මුසු නො වන්නට
තනි ව ම තමන් විසුමයි හැම අතින් සෙට

පූජ්‍ය ගන්තුනේ අස්සජි හිමි